# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ අංකය / எனது இல / My Ref. ED/05/67/01/පොදුVIII
ඔබේ අංකය / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2021.08.09

සියළුම අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන්
සියළුම ගුරු විද්‍යාලවල විදුහල්පතිවරුන්
සියළුම ගුරු මධ්‍යස්ථානවල කළමනාකරුවන්
සියළුම ජාතික පාසල්වල විදුහල්පතිවරුන්

**අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුයුක්ත සේවා කාලය දීර්ඝ කිරීම**

සිය නිත්‍ය සේවා ස්ථානයේ සිට වෙනත් සේවා ස්ථාන වෙත තාවකාලික අනුයුක්ත ලබා, එම අනුයුක්ත කාල සීමාවන් අවසන් කළ අධ්‍යාපන විද්‍යාපීඨවල, ගුරු විද්‍යාලවල, ගුරු මධ්‍යස්ථානවල හා ජාතික පාසල්වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් සම්බන්ධයෙන්, නැවත අධ්‍යයන කටයුතු සඳහා ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථාන විවෘත කරන තෙක් ඔවුන් අනුයුක්ත කරන ලද සේවා ස්ථානයෙහිම, අනුයුක්ත කාලය දීර්ඝ කළා සේ සලකා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

02. තවද, නැවත අධ්‍යාපන කටයුතු සඳහා නිත්‍ය සේවා ස්ථාන විවෘත කළ පසු ඔවුන් එම සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කළ යුතු අතර, පවත්නා කොවිඩ් උවදුරු තත්ත්වය හමුවේ රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රජය විසින් වරින් වර නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන විධිවිධානයන්ට යටත්ව, ආයතනයන්හි පවත්නා අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව සේවකයින් සේවයට කැඳවීමේ බලය අදාළ ආයතන ප්‍රධානීන් සතුවේ.

මහාචාර්ය කේ.කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය